**සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම - 2015**

---

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදු කරනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මතය ව්‍යාචනය සඳහා පදනම ලෙස දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උපචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම.**

---

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 55 ඡේදය ප්‍රකාරව වත්කමක් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ දින සිට එහි ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු වුවත් වටිනාකම රු. 7,125,829 ක් වූ සමාගමේ දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති රු. 12,881,658 ක වටිනාකමින් යුත් චලනය නොවන තොග අයිතමයන් හේතුවෙන් ඇති වන පාඩුව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව පාරිතෝෂික වෙන් කිරීම් රු.2,365,893 ක් වුවත් විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව එය රු.17,960,598 ක් වූයෙන් පාරිතෝෂික වෙන් කිරීම් රු.15,594,705 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්ය මණ්ඩලය වෙත ගෙවිය යුතු හිඟ වැටුප් රු.12,470,792 ක්, ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් දායකය රු.859,411 ක් හා සේවක භාරකාර අරමුදල් දායකය රු.181,350 ක් සඳහා අදාල උපලේඛන හා කාලවිශ්ලේෂණ ද රු.12,272,702 ක් වූ තොගය සඳහා අදාල උපලේඛන හා සත්‍යාපන වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කරන ලද කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව.**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මගින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු දන්වමි.

(අ) මතය සඳහා පදනම, විෂය පථය සහ සීමාවන් ඉහත සඳහන් පරිදි විය.

(ආ) මාගේ විගණන මතය අනුව

- විගණනය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.1,781,775 ක් වූ ලැබිය යුතු මුදල් ශේෂය වසරකට වඩා වැඩි කාලයක සිට පවතින අතර අයකර ගැනීම අවිනිශ්චිත ශේෂයක් විය. එම මුදල් අය කර ගැනීමට හෝ ප්‍රතිපාදන සැලසීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.880,589 ක් වූ දිගු කාලීන ගෙවිය යුතු ශේෂයන් නිරීක්‍ෂණ වූ අතර එම ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.4** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනත - 131 (01) වගන්තිය | සමාගම් පනත අනුව සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාව (පෝරම අංක 15) ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ලක්දිව ඉංජිනියරින් පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.408 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,048,921 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,049,329ක වර්ධනයක් ඇතිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ බස් රථ අළුත්වැඩියා ආදායම රු.10,397,967 කින් වර්ධනය වීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 සහ 2015 වර්ෂවල මූල්‍ය අතිරික්තයක් පැවතුනද 2011, 2012 සහ 2014 වර්ෂවල ඌනතාවයක් පැවතුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ රු.22,392,631 ක් වූ සමාගමේ දායකත්වය 2015 වර්ෂයේදී රු.235,136,697 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම ආරම්භ කිරීමේදී සමාගම විසින් සිදුකළ යුතු කාර්යභාරයන් ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ අඩු වියදමකින්, උසස් ප්‍රමිතියකින් සම්පූර්ණයෙන් සහ අර්ධ වශයෙන් අලුත්වැඩියාව සහ අනතුරට ලක්වූ බස් රථ අලුත්වැඩියාවන් සිදු කිරීම, බස් රථ බොඩි අලුත්වැඩියාව, ආසන කවර සහ ආසන සඳහා කුෂන් පිළියෙළ කිරීම සහ ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල වාහන අලුත්වැඩියා කිරීම යන කාර්යභාරයන් හඳුනාගෙන තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ පමණක් අලුත්වැඩියාව කර තිබුණු අතර ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් අනෙකුත් ආයතනවල වාහන අලුත්වැඩියා සිදුකර නොතිබුණි.

(ආ) (i) 2015 වර්ෂය සඳහා සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂයේ කාර්තු 04 සඳහා බස්රථ 96 ක් අලුත්වැඩියා කළ යුතු වුවත් බස්රථ 47 ක් පමණක් අළුත්වැඩියා කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළදී අලුත්වැඩියා කිරීමට සැලසුම් කළ බස් රථ සංඛ්‍යාවෙන් සියයට 49 ක් පමණක් ඉටුකර තිබුණි.

(ii) බස් රථ අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ 05 ක තොරතුරුවලට අනුව 2010 වර්ෂයේ බස් රථ 78 ක් අලුත්වැඩියා කර තිබුණද 2015 වර්ෂය වන විට අලුත්වැඩියා කළ බස් රථ සංඛ්‍යාව 47 ක් දක්වා ක්‍රමයෙන් අඩුවී තිබුණි.

(iii) ඩිපෝවලින් ලක්දිව ඉංජිනියරින් සමාගම වෙත බස් රථ භාරදීමෙන් පසු අලුත්වැඩියාව සඳහා ඉංජිනේරු අංශය වෙත යැවීමේදී දින 120 සිට දින 508 දක්වා වූ කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. අලුත්වැඩියා ආරම්භ කිරීමට පෙර මෙතරම් දීර්ඝ කාලයක් තබා ගැනීමට හේතු විගණනයට අනාවරණය නොවීය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිසි අනුමැතීන් සහ ප්‍රතිපාදනයන් නොමැතිව සේවයෙහි නියුක්ත කාර්යය මණ්ඩලය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ට වැටුප් පරිවර්තනයක් සිදුකර පිළිවෙලින් රු.10,512,055 ක් හා රු.1,958,737 ක් ගෙවිය යුතු වැටුප් හා වේතන ලෙස ගිණුම්වල ප්‍රතිපාදන සිදු කර තිබුණි. මෙම ගෙවිය යුතු මුදල් වෙනුවෙන් 2009 හා 2010 වර්ෂවල පිළිවෙලින් රු.1,693,000 ක් හා රු.254,000 ක් වැටුප් අත්තිකාරම් ගෙවා වසර 06ක් ඉකුත්වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම අත්තිකාරම් ගිණුම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අනුමැතියකින් තොරව සිදු කර තිබූ වැටුප් පරිවර්තනයන් පදනම් කරගෙන ගෙවිය යුතු වැටුප් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ලෙස පිළිවෙලින් රු. 859,411 ක් හා රු. 181,350 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සේවක දිරිදීමනා ලෙස රු.964,549 ක් ගෙවීම්කර තිබුණද දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ලක්දිව ඉංජිනියරින් පුද්ගලික සමාගමේ බස් රථ අලුත්වැඩියා කටයුතු සඳහා එම ආයතනයේ කාර්ය මණ්ඩලයට අමතරව කොන්ත්‍රාත් පදනම මත බාහිර ශ්‍රමිකයින් ලබාගෙන තිබුණු අතර එක් කණ්ඩායමක දෙදෙනෙකු බැගින් කොන්ත්‍රාත් කණ්ඩායම් 03 ක් සේවයට යොදවාගෙන ඒ සඳහා රු. 2,707,230 ක් ගෙවා තිබුණි. මෙම ශ්‍රම කොන්ත්‍රාත් කණ්ඩායම් තෝරා ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව ලංසු කැඳවීමක් හා සුදුසුකම් පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණු අතර ලිඛිත ගිවිසුමකටද එළඹී නොතිබුණි.

(ඉ) සීමිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම විසින් තම ව්‍යාපාර කටයුතු ඒකළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අක්කර 23 ක් පමණ විශාල වූ ඉඩමෙන් කොටසක පවත්වා ගෙන ගියද එම ඉඩම් කොටසේ නීතිමය අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂය සඳහා අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු. 8,084,081 ක් වැයකර තිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන් අනුගමනය කිරීමකින් තොරව ප්‍රසම්පාදන නිලධාරී පෞද්ගලිකව ආයතන 03 කින් ලබාගත් මිල ගණන් පදනම් කරගෙන මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ආ) 2015 වර්ෂය සඳහා අමතර කොටස් සැපයුම් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) බස්බොඩි අලුත්වැඩියාව සඳහා අවශ්‍ය අමතර කොටස් තොග වශයෙන් මිලදී ගැනීමට හැකියාව තිබියදී අමතර කොටස් අවශ්‍යවන අවස්ථාවේදී ඒකක ලෙස මිලදී ගැනීම නිසා තොග වශයෙන් මිලදී ගැනීමෙන් ලබා ගත හැකිව තිබූ ආර්ථික වාසි (වට්ටම්) අහිමි වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ තනතුරු 30 ක් වෙනුවෙන් 121 ක කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ කාර්ය මණ්ඩලය 65 දෙනෙකු වුයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් 56 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු අතර සමාගමේ අනුමත ප්‍රධාන තනතුරු වන සාමාන්‍යාධිකාරී, පරිපාලන නිලධාරි, ගිණුම් නිලධාරි, කර්මාන්ත ශාලා ඉංජිනේරු හා අභ්‍යන්තර විගණක නිලධාරි යන තනතුරු සඳහා නිලධාරීන් පත් කර නොතිබුණි. සමාගම පරිපාලන නිලධාරි හා ගිණුම් නිලධාරි තනතුරු සඳහා වැඩ ආවරණ නිලධාරීන් පත් කර තිබුණි. මේ අනුව ආයතනයෙහි ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් පත් නොකිරීම ආයතනයේ කටයුතු නිසි පරිදි සිදුකිරීමට බාධාවක් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය.

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් ( පුද්ගලික) සමාගම 2001 ඔක්තෝබර් 01 දින රජය සතු සමාගමක් ලෙස ස්ථාපනය කර තිබුණු අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2011 අගෝස්තු 15 දින ලියාපදිංචි කර තිබුණි. සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු. 10/- බැගින් වු සාමාන්‍ය කොටස් 650,000 කින් යුක්ත වු අතර එයින් කොටස් 2 ක් පමණක් නිකුත් කර තිබුණි. එම කොටස් දෙක මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් මිලදී ගෙන තිබුණි.

### 5.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 යි මාස 05 ක් ප්‍රමාද වී එනම් 2017 ජුලි 27 දින ඉදිරිපත්කර තිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ 3කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගමේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

### 5.5 ප්‍රසම්පාදන සැලැස්ම

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් 4.2.1 (අ) ඡේදය ප්‍රකාරව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------------

විගණනයේදී  නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්‍ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | i. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | ii | ස්ථාවර වත්කම් භෞතිකව ස්ථාපනය නොකිරීම |
| (ආ) | තොග පාලනය | i. | තොග සමීක්‍ෂණ සිදු නොකිරීම. |
| | | ii | පාවිච්චියට ගත නොහැකි තොග සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඇ) | ප්‍රසම්පාදන කටයුතු | | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකිරීම හා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකර මිලදී ගැනීම් සිදු කිරීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |